## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණයේ සුභ සාධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. **සම්බන්ධ වන ආයතන,**

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය
යොමු අංකය : GMA/SOR/MN-01(I) දිනය : 2019.11.01

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන අමාත්‍යාංශය
යොමු අංකය : එම්.ටී/03/05/07-I දිනය : 2019.11.15

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/F2/DR/01 දිනය : 2013.04.09
DMS/1142 දිනය : 2013.04.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/07/REC/1297 දිනය :2019.08.23

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/02/43/SR-II දිනය :2019.07.05

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/04-01-43/05/2019 දිනය :2020.09.29

**02.** **පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරී

**03.** **සේවා ගණය පිළිබඳ විස්තර,**

3.1 **සේවා ගණය** : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02

3.2 **ශ්‍රේණි** : III, II හා I

3.3 **පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය** : ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතරින් තාක්ෂණික ස්වාභාවයේ නොවන්නා වූද, ඒකල ස්වරූපයෙන් වූද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතරින් පත්කිරීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය

3.4 **කාර්යයන් පැවරීම** : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයනට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය

**04.** **තනතුරෙහි/තනතුරුවල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

## 05. වැටුප් :

**5.1** වැටුප් කේත අංකය : MN-01–2016

**5.2** මාසික වැටුප් පරිමාණය : රු.27,140-10X300-11X350-10X495-10X660-45,540/-

**5.3** ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු) |
|---|---|---|
| III | පියවර 01 | 27,140/- |
| II | පියවර 12 | 30,490/- |
| I | පියවර 23 | 34,485/- |

වැටුප් ගෙවීම සහ සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන වලට අනුකූල විය යුතුය.

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සුභ සාධන නිලධාරී | III, II,I ශ්‍රේණිය | 2 | ඒ ඒ උප දෙපාර්තමේන්තුවලට අදාළ සියළුම සුභ සාධන රාජකාරී කටයුතු ඉටු කිරීම. |

**6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :**

සුභ සාධන නිලධාරී -02

**සටහන :** ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100 % |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම :අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන -ඛණ්ඩ 02 (MN-01 ) සේවා ගණයේ තනතුරක හෝ ප්‍රාථමික ශිල්පීය ( PL-03) සේවා ගණයේ තනතුරක වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවෙ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5වෙනත්:

I. තනතුරේ ස්ථිර කර තිබීම.

II අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ / වෙබ් අඩවියේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.4.1 ලිඛිත විභාගය :- අදාළ නොවේ.

7.3.4.2 වෘත්තීයපරීක්ෂණය :- අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-අදාළ නොවේ.

**7.3.4.4** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක භාෂා දැනුම | 10 | අදාළ නොවේ |
| 2. බාහිර ක්‍රියාකාරකම් | 40 | |
| 3. ප්‍රශංසා සඳහා | 20 | |
| 4. සේවා පළපුරුද්ද | 25 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 5 | |
| මුළු එකතුව | 100 | |

සටහන:

1. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේදී ඉහත යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් අතුළත, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත්කිරීම බලධාරියා විසින් සිදු කෙරෙනු ඇත.
2. විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කළ යුතුයි.
3. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

7.3.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරි

7.3.5අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4** කුසලතා පදනම මත බඳවා ගැනීම: අදාල නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

**8.1**

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | වාචික (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ප්‍රගති සමාලෝචන වාර්තාව (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 03) |



9/

**8.2** කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද:වර්ෂයකට දෙවරක්

**8.3** කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද:

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම-<br>2 වන කාර්යක්ෂමතා කඩඉම-<br>3 වන කාර්යක්ෂමතා කඩඉම - | දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් |

## 09. භාෂා ප්‍රවීණතාව

**9.1**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම්

### 10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

**10.1.1** සාමාන්‍ය කාර්ය සාධනය අනුව

**10.1.1.1** සපුරාලිය යුතු සුදුසුකම් :

1. පත්වීම ස්ථිර කර තිබීම.

11. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

111. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය** :සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

**10.2.1** සාමාන්‍ය කාර්ය සාධනය අනුව

**10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:**

1. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

111. අනුමත කාර්යය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යයසාධනයක් පෙන්නුම් කර තිබීම.

VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම.

**10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය:**සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන්I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය:
සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම: අදාළ නොවේ.

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි: අදාල නොවේ

**13.**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ:

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන,එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ. "

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන - අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : ........................

ජේ.යූ.එස්. ගුණවර්ධන
පරිපාලන නිලධාරී (පත්වීම්; ආවරණ
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
මරදාන, කොළඹ 10.

නම : ........................

තනතුර : ........................

දිනය : 2020.11.03

පරීක්ෂා කළේ : අත්සන : ........................

(විෂය භාර මා [illegible]
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන)
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

නම : ........................

තනතුර : ........................

දිනය : 2020/11/09

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එම්. ජේ. ඩී. ප්‍රනාන්දු

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

නිල මුද්‍රාව :

දිනය : 2020.11.11

---

යොමු අංකය : එම ටී/03/05/07 - I

2020.09.29 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සුහ සාධන නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ........................

නම : ........................

ලේකම්

ප්‍රවාහන අමාත්‍යාංශය

එන්.බී.එම්. රණතුංග
ලේකම්
ප්‍රවාහන අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය (අදියර II
බත්තරමුල්ල

නිල මුද්‍රාව : ........................

දිනය : 2021.02.23

---

යොමු අංකය : PSC|EST|04-01-43/05|2019

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සුහ සාධන නිලධාරී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2020.09.29 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ........................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පා
බත්තරමුල්ල.

නිල මුද්‍රාව : ........................

දිනය : 2021/03/24

ඇමුණුම 01

**01.** විභාගයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩය 2 සේවා ගණයේ සුභ සාධන නිලධාරී තනතුර සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** විභාගය පිළිබඳ විස්තර :මෙම කාර්යක්ෂමතා කඩඉම වාචික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතනික කටයුතු | විනාඩි 05 | 40 | **40%** |
| 2. කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම | විනාඩි 05 | 30 | |
| 3. සාමාන්‍ය රාජකාරී කටයුතු | විනාඩි 05 | 30 | |
| **එකතුව** | **විනාඩි 15** | **100** | |

**03.** පවත්වනු ලබන නිලධාරීන් : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතනික කටයුතු | දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාල නව්‍යකරණයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම. |
| 2. කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම | සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන්ට අදාල ආසන්න කාලයේ සිදු වූ සංශෝධන පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| 3. සාමාන්‍ය රාජකාරී කටයුතු | තනතුරට පැවරෙන විවිධ කාර්යයන් වඩාත් පහසුවෙන් හා කාර්යක්ෂමව ඵලදායීව ඉටු කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවයක් අත්පත් කරගෙන ඇත්දැයි මැන බැලීම. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ......... එම්. ජේ. ඩී. ප්‍රනාන්දු

දුම්රිය සාමාන්‍යාධිකාරී

තනතුර : ....දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය

කොළඹ 10

දිනය : 2020.11.11

නිල මුද්‍රාව : ..................................

ඇමුණුම 02

01. විභාගයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩය 2 සේවා ගණයේ සුභ සාධන නිලධාරී තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| ප්‍රගති සමාලෝචන වාර්තාව | 100 | 40% |
| එකතුව | **100** | |

03. පවත්වනු ලබන නිලධාරීන් : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ප්‍රගති සමාලෝචන වාර්තාව | තම තනතුරට පැවරී ඇති කාර්යයනට අදාළව සිදු කර ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාවක් ඉදිරිපත් කිරීම. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එම්. ජේ. ඩී. ප්‍රනාන්දු

දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

තනතුර : ..........................................

දිනය : 2020 . 11 . 11

නිල මුද්‍රාව : ..........................................

01. විභාගයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩය 2 සේවා ගණයේ සුභ සාධන නිලධාරී තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා අදාල කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40% |
| එකතුව | | 100 | |

03. පවත්වනු ලබන නිලධාරීන් : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා අදාල කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ XII, XIII, XIV, XXIV, XLVII වැනි පරිච්ඡේද ඇසුරෙන් දැනුම හා අදාල කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එම්. ජේ. ඩී. ප්‍රනාන්දු

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය : 2020.11.11

නිල මුද්‍රාව : ..........................